# 1.22 ගවයා පිළිබඳ සමාජ ආකල්ප

එම්. බී.බුද්ධික ජයසුන්දර
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

කිසියම් ජීව අජීව වස්තුවක් හෝ සංසිද්ධියක් හෝ දීර්ඝ කාලයක් පුරා ජන සමූහයක් ඇසුරේ පැවතීම නිසා, එම වස්තුව හෝ සංසිද්ධිය හෝ කේන්ද්‍ර කරගෙන ගොඩනැඟෙන අදහස් උදහස් හා ඇදහිලි පද්ධතිය එම සමාජයට අයත් සමාජ ආකල්ප ලෙස හැඳින්විය හැකිය. විවිධ ජන සමාජවල සමාජ ආකල්ප ගොඩනැඟීමෙහිලා මිනිස් හැසිරීම්වලින් ඍජු බලපෑමක් ඇති කෙරේ. මිනිසාගේ ආගමික, ආර්ථික, සංස්කෘතික හා සමාජයීය හැසිරීම් සමඟ සම්බන්ධ ගෘහාශ්‍රිත සතුන් අතර ප්‍රමුඛත්වයෙහිලා සැලකෙන **'ගවයා'** කේන්ද්‍ර කරගෙන ගොඩනැඟුණු සමාජ ආකල්ප රැසක් හඳුනාගත හැකි වෙයි. ගවයා සම්බන්ධ මිනිස් හැසිරීම් විග්‍රහ කර බලන විට, ලොව විවිධ සමාජවල ගවයාට හිමි වන වැදගත්කම ඒ ඒ සමාජ විසින් අගයනු ලබන සමාජ සාරධර්ම මත රඳා පවතින බැවින් ගවයා සම්බන්ධ සමාජ ආකල්ප ද විවිධ ස්වරූපයෙන් සකස් වී ඇති බව පැහැදිලි වේ.

නියොලිතික යුගයේ දී මිනිසා විසින් ගෘහාශ්‍රිත කරගන්නා ලද සතුන් අතරින් ගවයාගේ භූමිකාව සුවිශේෂී වූවක් බව, ගවයා බොහෝ ජන සමාජවල පූජාර්ථයෙන් සලකනු ලැබීමෙන් පසක් වේ. විශේෂයෙන් ම පෙරදිග ශිෂ්ටාචාර කෙරෙහි අවධානය යොමු කරන කල එම සමාජවල ජනතාව ගවයාගෙන් තමන්ට ඉටුවන සුවිසල් මෙහෙවර පිළිබඳ සලකා, ගවයා තමන් සතු අගනා සම්පතක් සේ සිතා කටයුතු කළ බව හඳුනාගත හැකිය. කෘෂි ආර්ථිකයක් මත පදනම් වී ගොඩනැඟුණු ලොව ඉපැරණි ශිෂ්ටාචාර රැසකින් හමුවී ඇති පුරා විද්‍යාත්මක තොරතුරුවලට අනුව ගවයා සහ මිනිසා අතර පැවති සහ සම්බන්ධයට දිගු ඉතිහාසයක් ඇති බව පැහැදිලි වේ. මෙසපොතේමියානු, මිසර, ඉන්දු නිම්න හා මිනෝවන් ආදී ශිෂ්ටාචාරවලට අයත් මුද්‍රා, චිත්‍ර සටහන් හා මූර්තිවල නිරූපිත යම් යම් සිදුවීම් හා අවස්ථා විශ්ලේෂණය කරන විට පැරණි මිනිසා ගවයා කෙරෙහි ගෞරවයෙන්, භක්තියෙන් මෙන් ම බිය පක්ෂපාතිත්වයෙන් ද යුක්ත ව කටයුතු කළ බව පෙනේ.

ගවයා පූජනීයත්වයෙහිලා සලකන ලද සමාජ අතුරෙන් භාරතය ඉදිරියෙන් ම සිටී. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් (ක්‍රි.පූ.2150 - 1750) මොහෙන්ජෙදාරෝ සහ හරප්පා නගරද්වයයෙන් හමුවූ ගව රූප දක්නට ලැබෙන ටෙරාකොටා මුද්‍රාවලට අනුව **'මොල්ලිය සහිත ගවයා'** හෙවත් **'සේබු'** (**Zebu**) ගවයා පූජනීයත්වයෙන් සැලකූ බව අනාවරණය වේ. ඍග් වෛදික යුගය, පශ්චාත් වෛදික යුගය, මෙන් ම බුද්ධ කාලයේ ද ගවයා සම්පතක් ලෙස සැලකූ බව වෛදික, හින්දු හා බෞද්ධ ආගමික ග්‍රන්ථ පරිශීලනය කරන විට පසක් වේ. විශේෂයෙන් ම හින්දූන් අතර ගවයා පූජනීයත්වයට පත්වූයේ ශිව දෙවියන්ගේ වාහනය ලෙස ගවයකු යොදා ඇති බැවිනි. **'නන්දි'** නම් වූ වෘෂභ වාහනයේ ප්‍රතිමාව බොහෝ ශිව දේවාලවල දක්නට ලැබෙන බවත්, ඉඳහිට පූජාදියෙන් පිදුම් ලබන බවත් බෂාම් පවසයි. (අසිරිමත් ඉන්දියාව - 1962, 407 පිටුව) වර්තමානයේ දී ද ගවයකු මැරීම ආගමික වශයෙන් කෙලෙසීමක් ලෙස හින්දූන් විසින් සලකන ලද බැවින් අද දක්වාත් භාරත සමාජයේ ගවයාට පවතිනුයේ උසස් නිදහසකි.

සිංහල ජන ජීවිතය සහ ගවයා අතර ඈත අතීතයේ පටන් පැවති විවිධාකාර සම්බන්ධතා පදනම් කරගෙන ගොඩනැඟුණු ජනශ්‍රැති අංග, ඓතිහාසික හා සාහිත්‍ය ග්‍රන්ථාගත තොරතුරු ඇසුරින් ගවයා සම්බන්ධ ශ්‍රී ලාංකේය සමාජ ආකල්ප පද්ධතියේ ස්වරූපය හඳුනාගත හැකිය. ලොව බොහෝ ජන සමාජවල කෘෂිකාර්මික කටයුතු සඳහා ශ්‍රම දායකත්වයක් ලබා දුන් ගවයාට දේවත්වාරෝපණයෙන් සැලකිලි දැක්වුව ද ලංකාවේ පැවතියේ ඊට වඩා වෙනස් ස්වරූපයකි. ස්වකීය ජීවන අරගලයට උරදෙන සතුන් කෙරෙහි කෘතවේදී ආකල්පයකින් කටයුතු කිරීම සිංහල සමාජයේ විශේෂ ලක්ෂණයක් බැවින් සිංහලයාට ගවයා සහලේ ඥාතියකු, සහජාත පුත්‍රයකු හා සමාන විය. එම කෘතවේදී ආකල්පය බෞද්ධ චින්තනයෙන් ඔප් නැංවීම නිසා සිංහල සමාජයෙහි ගවයා සම්බන්ධයෙන් කටයුතු කළේ කරුණාව, මෛත්‍රිය පෙරදැරි කරගත් හැඟීමෙන් යුතුවය. නමුත් නූතන තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතයට පැමිණීම නිසා ගවයාගෙන් මිනිස් කටයුතු කෙරෙහි ලැබුණු දායකත්වයට සීමා පැනවීමත් සමඟ ගවයා සම්බන්ධයෙන් පැවති සුහද ආකල්ප විපරිණාමයට පත් ව තිබේ. මේ පර්යේෂණයේ අරමුණ වන්නේ දුරාතීතයේ පටන් මිනිස් ක්‍රියාකාරකම්වල දී ප්‍රබල සහායකයකු වශයෙන් කටයුතු කළ ගවයා සම්බන්ධයෙන් ගොඩනැඟී ඇති සමාජ ආකල්ප පිළිබඳ විමර්ශනයක යෙදීමයි.